**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2022 ජූනි 29 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිල මැදුර ගොඩනැගිල්ලේ විදුලි හා ජල බිල්පත් එහි ස්ථාපිත ආයතනවල භාවිතා කරන බිම් ප්‍රමාණය අනුව විදුලි බිල අයකළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි. මේ හේතුව නිසා වාර්ෂික විදුලි හා ජල බිල වූ රු.44,995,794න් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලය භාවිතා කරන වර්ග ප්‍රමාණය අනුව අයවිය යුතු විදුලි හා ජල බිල රු.23,973,170ක් විය. ගිණුම අනුව එය රු.26,621,115ක් වූයෙන් රු.2,647,945ක වෙනසක් නිරීක්ෂණය විය. | වැය ලෙජරය අනුව ශේෂය නිවැරදි බව දන්වා ඇත. | වියදම් ගිණුම් තැබිමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වියදම නිවැරදිව ගණනය කර ගිණුම් තැබිය යුතුය. |

#### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(i)** රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.203,620,678 ක් හා භාණ්ඩාගාර පොත් අනුව රු.204,771,372ක් විය. 2013 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 09 ක කාලයක් ඉකුත් වී තිබුණද නිරවුල් කර නොතිබුණු රු.1,150,694ක් වූ නොසැසඳුණු හර ශේෂය මෙයට හේතු වී තිබුණි. | මෙම නොවිසඳුණු ශේෂය පොතින් කපා හැරීමට නිර්දේශ ඉල්ලා වාර්තාවක් රාජ්‍ය ගිණුම් කාරක සභාව හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇති බව දන්වමි. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසට අදාල සැසඳුම් නොකළ ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සේවා ස්ථාන මාරු වීම, මිය යාම, විශ්‍රාම යාම, වැඩ තහනම් කිරීම හා සේවය හැර යාම යනාදී හේතූන් මත සේවකයන් 35 දෙනෙකුට අදාළව 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතු ණය ශේෂය රු.3,631,960ක් පැවති අතර ඉන් රු.1,257,867ක් වූ ණය ශේෂ 19 ක් වර්ෂ 2කට වැඩි කාලයක සිට අය විය යුතුව පැවතුණි. | මොරටුව නගර සභාවට ස්ථාන මාරු වී ගිය එක් නිලධාරියෙකුගේ රු.113,607ක්වූ ණය ශේෂයෙන්, රු.450 ක මාසික වාරික වශයෙන් ද, විශ්‍රාම ගිය නිලධාරීයකුගෙන් රු.1,020 ක මාසික වාරිකය ඔහුගේ විශ්‍රාම වැටුපෙන්ද, වැඩ තහනම් කළ නිලධාරීන් 12 දෙනෙකුගෙන් අයවිය යුතු ශේෂය රු.1,007,794 ක් වූ අතර විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල සාකච්ඡා කරමින් මෙම ප්‍රමාණය දැනට පවතින මුදල දක්වා අඩු කර ගැනීමට කටයුතු කර ඇත. හිඟහිටි කාලය වර්ෂ 04 සිට 05 දක්වා වූ රු.134,430 ක් සේවය හැරගිය නිලධාරියෙකුගේ ණය ශේෂයක් නැවත සේවයේ පිහිටුවීමෙන් අනතුරුව අයකර ගැනීමටද කටයුතු කරමි. | අදාල නිලධාරින්ගෙන් හිඟහිටි ණය ශේෂ එකවර අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**(ඇ)** **තැන්පතු**

**---------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ---------- |
| (i) | භාණ්ඩාගාර පොත් අනුව තැන්පතු ගිණුම් ශේෂය රු.953,922,168ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව එම ශේෂය රු.963,922,168ක් වූයෙන් රු.10,000,000 වෙනසක් නිරීක්ෂණය විය. වර්ෂ 14 කට අධික කාලයක් ගතවී තිබුණද, 2019 ඔක්තෝබර් 15 දිනැති හා අංක 269/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.7 ඡේදයේ විධිවිධාන ප්‍රකාර පියවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2007 වසරේ සිට පැවත එන මෙම පොදු තැන්පත් ගිණුමේ මිලියන 10ක හර ශේෂය පිළිබඳව 2017 ජනවාරි 26 දිනැති රාජ්‍ය ගිණුම් කටයුතු පිළිබඳ කාරක සභාවේ සාකච්ජාවට භාජනය විය. එහිදි ලද උපදෙස් මත කමිටුවක් පත්කරන ලද අතර එම කමිටු නිර්දේශය වූයේ කපාහැරිම සුදුසු බවය. ඒ අනුව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ජාවක් පැවැත්වූ අතර එහිදී ගත් තීරණය වූයේ මෙම | මෙම හර ශේෂය නිරවුල් කර ගැනීමට චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පොදු තැන්පත් ගිණුමේ හර ශේෂය ඇති වු කාලයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කල නිලධාරීන් ගෙන්වා නැවත විමර්ශනයක් සිදු කරන ලෙසයි. ඒ අනුව එම නිලධාරින් කැඳවා විමර්ශනයක් පවැත්වූ අතර අදාල වාර්තාව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2022.03.09 දින ඉදිරිපත් කරන ලදි.<br>එම වාර්තාව අනුව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් දන්වා සිටියේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් අදාල වරද නිවැරදි කිරීමේ සටහන ගිණුම් තබන ආකාරය පිළිබඳ උපදෙස් ලබාගන්නා ලෙසය. 2022.04.26 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අමතා උපදෙස් ලබා දෙන ලෙස ලිපියක් යොමු කලද මෙය තවදුරටත් නොවිසඳී ඇත. | |
| **(ii)** | වන්දි ගෙවීමට පෙර තිබෙන ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන මූලික කටයුතු කඩිනමින් නිම කර ඉඩම් වන්දි ගෙවා එම තැන්පතු ශේෂ නිරවුල් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණෙන් වන්දි ගෙවීම් තැන්පතු ගිණුමේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 කට අදාළව වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් කල් ඉකුත් වූ තැන්පතු වටිනාකම රු.102,827,540 ක් නිරික්ෂණය විය. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 03 කට අදාළව තැන්පතු 38 ක රු.12,127,493 ක් වර්ෂ 10කට වඩා පැරණි ශේෂ විය. මුදල් රෙගුලාසි 570(අ) අනුව ඉඩම් වන්දි තැන්පත් කල දින සිට වර්ෂ 10 ක් ගතවූ පසු ඉකුත් තැන්පත් ලෙස රජයේ ආදායමට බැර කළ යුතු වුවද එම ශේෂ සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | ඉඩම් සඳහා වන්දි ගෙවීම් සඳහා පවත්වාගනු ලබන පොදු තැන්පතු ගිණුමේ නොවිසඳුනු ශේෂයන් පවතින බව පිළිගනිමි. මෙම ශේෂයන් අතර ක්‍රියාකාරී ගොනු පවතින බවත් එම ගොනු සම්බන්ධව කඩිනම් ක්‍රියාමාර්ග ගැනීමටත් අනෙකුත් ගොනු සම්බන්ධව පරීක්ෂා කර බලා රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරමි. | තැන්පතු නිදහස් කිරීම සඳහා පවතින ගැටළු කඩිනමින් විසඳාගෙන මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව නිරවුල් නොවූ තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (iii) | ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය හා මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් නිලමැදුර ගොඩනැගිල්ලෙහි එම ආයතන විසින් භාවිතා කරන මහල් සඳහා 2021 වර්ෂයේ විදුලිය සහ ජලය බිල්පත් වියදම් ප්‍රතිපූර්ණය සඳහා පිළිවෙලින් රු.6,946,207ක් හා රු.1,011,589ක් ලැබී තිබුණ ද, වියදම සඳහා ගැලපීම් සිදු නොකර පොදු තැන්පත් ගිණුමේ පැවතුණි. | විගණන නිරීක්ෂණ අනුව පෙන්වා දී ඇති පොදු තැන්පතු ගිණුමේ ශේෂයන් සඳහා ගැලපීම් සිදු කර ඇත. | වියදම් ප්‍රතිපූර්ණය සඳහා ලැබුණු මුදල් අදාල වර්ෂය තුළදීම නිරවුල් කළ යුතුය. |

**(ඇ) දේපල පිරියත හා උපකරණ**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------- | ------------ |
| (i) | ඉකුත් වර්ෂය අවසානයට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.8,430,427,962ක් වුවද සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස රු.8,459,216,204ක් දැක්වීම හේතුවෙන් රු.28,788,242ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණය පිළිගනිමි. හඳුනාගන්නා ලද ආරම්භක ශේෂයන් හා අපහරණ ශේෂයන් පසුගිය වර්ෂයේ දිනයකින් ඇතුළත් කිරිම නිසා මෙම වෙනස ඇති විය. | නිවැරදි ශේෂය ගිණුම්වල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.341,558,089ක් වුවද භාණ්ඩාගාරයේ සටහන් අනුව එය රු.312,774,417ක් වුයෙන් රු.28,783,672ක වෙනසක් නිරීක්ෂණය විය. | - එම - | - එම - |
| (iii) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත හා උපකරණ ලෙස රු.8,777,578,249ක් දක්වා තිබුණද එම වත්කම්වල කේවල ශේෂ සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරිපත් නොකෙරුණි. ඒ වෙනුවට ඉදිරිපත් කරණු ලැබු පරිඝණක දත්ත වාර්ථාව අනුව | ස්ථාවර වත්කම් ලේඛනයක් ඉදිරිපත් කිරිමට නොහැකි වුවද, BOS Report ලබාදුන් බව දන්වමි. | ස්ථාවර වත්කම් ලේඛනය හෝ ඒ වෙනුවට භාවිතා කරන පරිගණක දත්ත වාර්තාව කේවල ශේෂවලට අදාල සියලුම තොරතුරු ඇතුළත් වන පරිදි එක් එක් වත්කම් කාණ්ඩගත වන පරිදි පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කේවල ශේෂ තොරතුරු එනම් ගත්මිල, ගත්දිනය හා අනුක්‍රමික අංකය වැනි වත්කම හඳුනා ගැනීමට අදාලවන තොරතුරු ඇතුළත් කර පිළියෙල කර නොතිබුණි. එම පරිසනක දත්ත වාර්තාවෙහිම කාණ්ඩගත කරණු ලැබූ ශේෂයන්ගේ එකතු වටිනාකම භාණ්ඩාගාර වගුවේ ශේෂයන් සමග නොසැසදිණි. | | |
| **(iv)** | රත්මලාන හා සීතාවක ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අයත් නිල නිවාසවල වටිනාකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව පිළිවෙලින් රු.5,120,000 ක් හා රු.8,000,000 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් ලබාදුන් CIGAS වාර්තාවන් අනුව එය පිළිවෙලින් රු.6,970,000 ක් හා රු.130,500,000 ක් වුයෙන් රු.1,850,000 ක් හා රු.122,500,000 ක් වෙනසක් නිරික්ෂණය විය. | සිගාස් වැඩසටහනට වත්කම් ආරම්භක ශේෂයක් ලෙස ඇතුළත් කිරිමට යම් කාලයක් පමණක් ඉඩදී තිබෙන බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නිවැරදි අගයන් ලද පසු සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට සටහන් කර ගතිමි. | නිල නිවාස සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන වාර්තාවන් හා CIGAS වාර්තාවන්වල නොසැසදීම් පරීක්ෂා කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය. |
| **(v)** | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 කට අයත් නිල නිවාස 05ක වටිනාකම තක්සේරුකොට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරුකොට නිවැරදි අගයන් සිගාස් වැඩසටහනට ඇතුළත් කරන බව දන්වමි. | නිල නිවාසවල වටිනාකම තක්සේරුකොට මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරිමට කටයුතු කළ යුුතුය. |

**(ඉ)** **අග්‍රිම ශේෂය**

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ---------------------------- | ----------- |
| සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ලැබීම් හා ගෙවීම් දෙපාර්තමේන්තු පොත් අනුව රු.10,943,141,463ක් වුවත් භාණ්ඩාගාර පොත් අනුව එය රු.11,047,371,463ක් වූයෙන් රු.104,230,000ක වෙනසක් නිරීක්ෂණය විය. | අග්‍රිම ගිණුමට භාණ්ඩාගාරය විසින් 2021 පෙබරවාරි 10 දින පිළිවෙලින් රු.57,380,000 ක් හා රු.46,850,000 ක් වැරදීමකින් ලැබීම් ලෙස ඇතුළත් කර නැවත එම වටිනාකම ගෙවීම ලෙස ඇතුළත් කර ඇත. මේ සම්බන්ධව මාරු පත්‍රයක් | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් සසඳා වෙනස නිරවුල් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නොලැබීම හේතුවෙන් ගිණුම්වල නිවැරදි කිරීමට නොහැකි විය. | |

**(ඊ) ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාල කටයුතු සම්බන්ධව ක්‍රියාකාරී සැලැස්ම හා ඊට අදාල වාර්තාවලට අනුව කටයුතු කරනු ලබන අතර ඒ සම්බන්ධව අභ්‍යන්තර පාලන පද්ධති හා සමාලෝචනයන් සිදු කරනු ලබන බවත් ග්‍රාම නිලධාරී කාර්යාල සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරීක්ෂාව යන පසුවිපරම් කිරීම් මූල්‍ය කළමනාකරණයට අදාල ප්‍රගති සමාලෝචනයන් සහ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සාකච්ඡාවට බඳුන් කිරීම, ප්‍රාදේශිය ලේකම් සම්මේලනය මාසිකව පැවැත්වීම මගින් අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කරමින් පද්ධති සඵලදායි ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගනු ලබන බවද එම කරනු ලබන සමාලෝචනයන්ට අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් දුන් බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 3,364ක් වූ අතර ඉන් රු. මිලියන 2,857ක් වර්ෂය තුළ වැයකර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය රු. මිලියන 507ක් හෙවත් සියයට 15ක් වූ අතර, සියයට 36.78ක් වූ මූලධන ප්‍රතිපාදනයේ ඉතිරිය ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. | 255-1-1-0-2104 වැය විෂය ඇස්තමේන්තු කිරීමේදී සිදුවූ වරදක් බවද අනෙකුත් වැය විෂයන් සම්බන්ධයෙන්, 2021 වර්ෂයේ පැවති ගෝලීය වසංගත තත්ත්වය සමඟම අත්පත් කර ගැනීම් හා මිලදී ගැනීම් කටයුතු සීමා කිරීම සහ 2021 අගෝස්තු 28 දිනැති 21/1596/304/134 අංක දරන අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් වියදම් කළමනාකරණය සම්බන්ධයෙන් සීමා පැනවීම හේතුවිය. | ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |
| (ආ) | වැය විෂය අංක 255-1-1-3-1205 යටතේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මහජනතාවට අඩු මිලට ලබාදීමට ක්‍රමවේදයක් සකස් කිරීම වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු මත ලබාදුන් රු.3,000,000ක ප්‍රතිපාදනයෙන් රු.1,850,417ක් එනම් සියයට 61.68ක් උපයෝජනය කර නොතිබුණි. | සහන මිලට අත්‍යාවශ්‍ය ආහාර කූඩ ලබාදීම වෙනුවෙන් වූ මෙම වැඩසටහන සංවිධානය කර තිබුණේ නුවරඑළිය, හම්බන්තොට හා අනුරාධපුර ගොවිපලවල් වලින් අතිරික්ත එළවළු නිෂ්පාදන කොළඹ දිස්ත්‍රික්කයට ගෙනවිත් කොළඹ දිස්ත්‍රික්කයේ තොග වෙළඳුන් සම්බන්ධීකරණය කරමින් තොග මිලට අලෙවි කිරීමය. නමුත් එළවළු නෂ්ට වීම, ප්‍රවාහන හානි හා නිසි පරිදි වෙළඳපොල හඳුනා නොගැනීම නිසා මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට සිදු විය. | නිශ්චිත කාර්යයක් වෙනුවෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමේදී නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතරම එය කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | එකතුව රු.1,464,800,000ක් වූ වැය විෂයන් 20ක මුල් වියදම් ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ සංශෝධනයට ලක්කර තිබුණු අතර එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 77 සිට සියයට 334ක් දක්වා වූ පරාසයක පැවතුණි. | නිරීක්ෂණ පිළිගනිමි. | ඇස්තමේන්තු නිවැරදිව සකස් කළ යුතුය. |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------------- | ----------- |
| (අ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව "බැදීම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය" ආවරණය වන පරිදි සිගාස් (CIGAS) ගිණුම්කරණ පද්ධතිය යාවත්කාලීන කර ඇති බැවින් ගනුදෙනු සම්බන්ධ ක්‍රියාවලියේ සියලුම පියවරයන් සිගාස් වැඩසටහනට ඇතුළත් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු බව සඳහන් වේ. එසේ වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල CIGAS වාර්තා පරීක්ෂා කිරීමේදී එසේ සිදුකර නොතිබුණි. භාණ්ඩාගාර ප්‍රකාශයේ (SA – 92) හි ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක 2018, 2019 සහ 2020 යන වර්ෂවලට අදාලව හඳුනාගනු ලැබූ රු.500,487ක බැදීම් හා බැරකම් ශේෂයක් 2021 දෙසැම්බර් 31 දිනවන විටත් සිගාස් ගිණුම්කරණ පද්ධතියේ පවතින බව නිරීක්ෂණය විය. | අතපසු වීමකින් සිදු වී ඇති බැවින් ඉදිරියේදී එවැනි තත්ත්වයන් සිදු නොවීමට අදාල නිලධාරීන්ට උපදෙස් දී ඇත. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදයෙහි දක්වා ඇති ආකාරයට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන් iii) දැක්වෙන බැරකම් භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් විෂයයන්ට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් | 2021 වර්ෂයට අදාල බැරකම් CIGAS වැඩසටහනට ඇතුළත් කිරීම සඳහා 2022 ජනවාරි 21 දින දක්වා කාලය ලබා දී තිබුණද බොහෝ බැරකම් එම දිනෙන් පසුව වාර්තා වූ බැරකම් වන අතර එම බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණද CIGAS වැඩසටහනට | - එම - |

| | | |
|---|---|---|
| ප්‍රකාශයේ (SA – 92) බැරකම් ශේෂය සමඟ සැසඳී තිබිය යුතුය. නමුත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් iii අනුව බැරකම් ශේෂය රු.6,430,089 ක් හා භාණ්ඩාගාර ප්‍රකාශයේ (SA – 92) අනුව රු.515,187ක් වූයෙන් රු.5,914,902ක වෙනසක් නිරීක්ෂණය විය. | බැරකම් ලෙස ඇතුළත් කර නොතිබීම හේතුවිය. | |

3. **මෙහෙයුම් සමාලෝචනය**
----------------------------

3.1 **සැලැසුම් කිරීම**
---------------

| **විගණන නිරීක්ෂණය** | | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම | | |
| (i) | අදාළ වර්ෂයට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය හා දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු වුවත්, කාර්යය මණ්ඩල විස්තරවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්යය මණ්ඩල විස්තරය ඇතුළත් කර නොතිබුණි. තවද, කාර්ය මණ්ඩල විස්තරවල අතිරේක දිස්ත්‍රික් ලේකම් තනතුරු දෙකක් සඳහන් කළද ඒ අනුව ආයතනයේ සංවිධාන ව්‍යුහය යාවත්කාලීන කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරි වර්ෂවලදී නිරීක්ෂණවලට අවධානය යොමු කරමින් කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ii) | අදාළ වර්ෂය සඳහා අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස්කළ ක්‍රියාකාරකම් සැලැස්ම වෙනුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංශ විසින් ඉටුකරනු ලබන දෛනික කාර්යයන් ඉදිරිපත් කර තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් පමණක් අයවැය ඇස්තමේන්තු සකස් කරනු ලබන ආයතනයක් නොවන අතර විශාල කාර්යය ප්‍රමාණයක් සම්බන්ධීකරණය කරනු ලබන ආයතනයක්ද වේ. එම නිසා අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරී සැලැස්මද සකස් කරනු ලබන අතර ඊට සමගාමීව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලබන ආංශික කාර්යන් ද සැලකිල්ලට ගනිමින් වාර්තාව සකස් කිරීම. | - එම - |

| | | | |
|---|---|---|---|
| (iii) | සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණ නිවැරදි වේ. | සියලුම ප්‍රසම්පාදන සැලසුම් ඉදිරිපත් කළ යුතුය. |

**3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------------- | ------------ |
| (අ) | විමධ්‍යගත අයවැය වැඩසටහන් යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 06කට අදාලව රු.2,990,000ක ප්‍රතිපාදන අනුමත කරන ලද ව්‍යාපෘති 16ක එනම් රු.105,000කට අදාල භාණ්ඩ හා සේවා ව්‍යාපෘති දෙකක්ද, රු.2,885,000කට අදාල ඉදිකිරීම් ව්‍යාපෘති 12ක්ද 2021 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | විමධ්‍යගත අයවැය වැඩසටහන සම්බන්ධයෙන් විගණන විමසුමේ පෙන්වා ඇති පරිදි අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොමැති ව්‍යාපෘති බව පිළිගනිමි. මෙවැනි ව්‍යාපෘති ඉදිරි වසරවලදී වෙන් කරනු ලබන ප්‍රතිපාදන මත යෝජනා කිරීමට නිලධාරීන් දැනුවත් කළ බව. | අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන - යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන I හි අනුමත ව්‍යාපෘති 47කි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට සමස්ත වියදම රු.54,502,410 ක් හා අතැති බිල් වටිනාකම රු.8,995,587 ක් බව නිරීක්ෂණය විය. ඉන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයත් රු.441,000 කට අදාල ව්‍යාපෘතියක් අවලංගු කර ඇති අතර රු.559,000 කට අදාල ව්‍යාපෘතියක් 2021 දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් කිරීමට අසමත් වී තිබුණි. | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘති දෙකක් පමණක් සිදු කිරීමට නොහැකි වූ අතර අනෙකුත් සියලුම ව්‍යාපෘති සිදු කර අවසන්ය. | අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 09ක් සහ මහරගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වූ හානියට වර්ෂ 06කට අධික කාලයක් ඉකුත් වී තිබුණි. නමුත් එම හානිවලින් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණු පාඩු හා හානි වටිනාකම පිළිවෙලින් රු.92,606,688ක් සහ රු.629,492ක් වශයෙන් එකතුව රු.93,231,180ක් විය. වර්ෂ 09ක් ගත වන තුරුත් මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණු බැවින් එම හානි අයකර ගැනිම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්ලයීය සහ මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය ගිනි ගැනීමට අදාල පොලිස් විමර්ශන තවමත් අවසන්ව නොමැති බව දන්වා ඇත. | පාඩු හා හානි පිළිබඳව පරීක්ෂණ කඩිනමින් පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන්ට හා සේවකයන්ට එරෙහිව විනය කටයුතු හා රජයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඊට වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් පූර්ණය කර ගැනීමට හා අනතුරුව හානි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගණනය කිරීමේ හා පරිවර්තනය කිරීමේ දෝෂ, විශ්‍රාම වැටුප් දෙවරක් ගෙවීම, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව තහවුරු කර ගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීම, හමුදා විශ්‍රාම වැටුප් සඳහා දෙවරක් ජීවන වියදම් දීමනා ගෙවීම යනාදී විවිධ හේතූන් මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13ට අදාළ බල ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන්ට අවිධිමත් හා අක්‍රමිකතා සහිතව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2021 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාමිකයන් 167 දෙනෙකුගෙන් එලෙස වැඩියෙන් ගෙවන ලද නමුත් තවදුරටත් අය විය යුතුව පවතින විශ්‍රාම වැටුප් වටිනාකම රු.24,207,556ක් වූ | මෙම වැඩිපුර ගෙවීම් බොහොමයක් අපගේ පාලනයෙන් තොරව සිදුවන කරුණු වන අතර ඉතා අවම පුහුණු නිලධාරි දායකත්වය මත මෙම ගණනය කිරීම උපරිම නිරවද්‍යතාවයෙන් යුතුව සිදුකරනු ලබන බව ද මෙම වැඩිපුර ගෙවීම් අවම කර ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව අවස්ථා කිහිපයකදීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව මෙන්ම වාචිකවද යෝජනා ඉදිරිපත් කර ඇතත් ඒ සම්බන්ධයෙන් මේවන තෙක් කිසිදු යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත. | විශ්‍රාම වැටුප් නිවැරදි හා විධිමත් ලෙස සකසා ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ගෙවීමටත් විශ්‍රාමිකයන් සම්බන්ධයෙන් ජීවතුන් අතර සිටින විශ්‍රාමිකයන් වෙනුවෙන් පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර එම මුදලින් රු.21,475,400ක් වර්ෂ 05 කට අඩු කාලයක් හා රු.2,732,156ක් වර්ෂ 5-10 ත් අතර කාලයක සිට අයවිය යුතුව පැවතුණි. | තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා විශ්‍රාම වැටුප් ගෙවනු ලබන්නේ තැපැල් කාර්යාල, ග්‍රාමීය බැංකු සහ සණස සමිති මගින් සාමාන්‍යයෙන් විශ්‍රාමිකයන් 5191 දෙනෙකු (2022 මැයි 31 දිනට) වෙත පමණක් වන අතර අදාල විශ්‍රාමිකයා මියගිය පසු වැඩිපුර ගෙවීමක් සිදු නොවන බවත් යම් හෙයකින් ගෙවීමක් සිදු වුවත් එය නැවත අයකර ගැනීමේ හැකියාව පවතින බවත් දන්වා ඇත. | |
| (ආ) | කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමෙහි අනවසර පදිංචිකරුවන් 11 දෙනෙකු පදිංචිව සිටින අතර ඔවුන් ඉවත්කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවට දැනුම් දී තිබුණද ඊට සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | සන්තක ආපසු ලබා ගැනීමේ පනත යටතේ මූලිකවම අදාල අනවසර ඉඩම් තුලින් ඉවත් වන ලෙස අනවසර පදිංචිකරුවන්ට ඉවත් වීමේ දැන්වීම් යොමු කර ඇති අතර ඉන්පසුව ඉවත් නොවුව හොත් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ඉඩමේ නිරවුල් අයිතිය ලබා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරිමට ප්‍රථම ප්‍රාදේශිය ලේකම් බල කොට්ඨාශයට ගැනෙන වසම් හා සීමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතු වුවද, 1999 මාර්තු 03 දින සහ 1999 මැයි 19 දින ආරම්භ කර ඇති පිළිවෙලින් තිඹිරිගස්යාය සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කොට කොට්ඨාශ ස්ථාපිත කිරීමේ ගැසට් නිවේදන ප්‍රකාශයට පත්කර නොතිබුණි. | තිඹිරිගස්යාය සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙනුවෙන් අදාළ සීමාවන් නිර්ණය කරමින් සකස් කරන ලද කෙටුම්පත් වාර්තාව ඉදිරි කටයුතු සඳහා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීමට ප්‍රථම එම ලේකම් බල කොට්ඨාශවලට ගැනෙන වසම් හා සිමාවන් නිර්ණය කොට ත්‍රෛභාෂාවෙන් ගැසට් පත්‍රයේ පළකළ යුතුය. |
| (ඈ) | මහරගම නගර සංවර්ධනය සඳහා ඉඩම් අත්කර ගැනීම යටතේ ගමනාගමන මණ්ඩලයට අයත් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය පවරාගෙන තිබුණද, 2016 පෙබරවාරි | එම මුදල ගෙවීමට අදාලව ඉදිරි වර්ෂවලදී වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේ දී අවදානයට ගෙන සකස් කිරීමටද වන්දි මුදල් සඳහා | අදාළ ප්‍රතිපාදන ලබාගෙන වන්දි මුදල ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 02 දිනැති තක්සේරු දෙපාර්තමේන්තුවේ වන්දි මුදල් තක්සේරු වටිනාකම වන රු. මිලියන 112ක් ගමනාගමන මණ්ඩලයට ගෙවා නොතිබුණි. | ප්‍රතිපාදන වෙන්කර ගත් පසුව එම මුදල් ගෙවීමටද කටයුතු කරමි. | |
| (ඉ) | කොළඹ, දෙහිවල, කොලොන්නාව, කැස්බෑව සහ හෝමාගම යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය පවරා ගැනීම සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ මෙම ඉඩම්වල ඉදිකිරීම් කටයුතු සඳහා එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් රජයේ මුදල් විශාල වශයෙන් වැය කර තිබුණි. | කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල සහ භූමිය වෙන්කර දෙන ලෙස 2016 ජුනි 08 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර ඇති නමුත් මේ දක්වා මැනීම් කටයුත්තක් සිදු කර නොමැත.<br>දෙහිවල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩම, දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව සතු බවටත්, කොලොන්නාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම, අත්පත් කරගත් ඉඩමක් වන නමුත් දැනට එම තොරතුරු සොයාගැනීමට නොමැති අතර නව ගොනුවක් විවෘතකර අයිතිය පවරා ගැනීමේ කටයුතු සිදු කිරීමට කඩිනම් පියවර ගැනීමට උපදෙස් දුන් බව.<br>කැස්බෑව හා හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාල පිහිටි ඉඩම් රජයේ ඉඩමක් බව. | ප්‍රාදේශිය ලේකම් කාර්යාල පිහිටි ඉඩම්වල අයිතිය පවරා ගැනිමට කඩිනම් පියවර ගත යුතුය |
| (ඊ) | තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප්වලට අදාළ සිවිල් විශ්‍රාමිකයන්ගේ ලිපිගොනු 125ක් සහ වැන්දඹු හා අනත්දරු විශ්‍රාමිකයන්ගේ ලිපි ගොනු 212ක් ද වශයෙන් ගොනු 337ක් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ හෝ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව තුළද නොමැති බව නිරික්ෂණය විය. නමුත් එම විශ්‍රාමිකයන්ට අදාළ තාවකාලික | අස්ථානගතවී ඇති ගොනු 07ක් හමු වී ඇති බවත් තාවකාලික ගොනු 108ක් සකස් කර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකගේ අනුමැතියට යොමු කර ඇති බවත්, තවදුරටත් පවතින අස්ථානගත ගොනු සම්බන්ධව සොයා බැලීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | අස්ථානගතවූ විශ්‍රාම වැටුප්වලට අදාළ පැරණි ලිපිගොනු සොයාගැනීමට හෝ තාවකාලික ලිපිගොනු නැවත සකස් කිරිමට විධිමත් සහ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු අතර ලිපිගොනුවල ආරක්ෂාව හා පැවත්ම තහවුරු කෙරෙන පාලන ක්‍රමවේදයන් හඳුන්වා දිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලිපිගොනු නැවත සකස් කිරිම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විධිමත් සහ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (උ) | අවිස්සාවේල්ල කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාල කුලී ආදායම 1999 සිට අය කරගෙන නොතිබුණි. අදාල නිවාසවල හිමිකම ලබා ගැනීම සඳහා කුලී නිවැසියන් විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබුණු නඩුවේදී තීරණය කර තිබුණේ අවිස්සාවේල්ල මානික්කවත්ත ඉඩමෙන් එක් පුද්ගලයෙකුට පර්චස් 20 බැගින් ඉඩම් කොටස් ලබා දීමටත් එම ඉඩම් කොටස්වල වටිනාකම ලබා ගැනීමේදී නිල නිවාසවල වටිනාකම හා ඉඩම් කොටස්වල තක්සේරුව ප්‍රධාන තක්සේරුකරුගෙන් ලබා ගෙන ගෙවීමට ඇති ණය මුදල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පොලී රහිතව ණය මුදලක් ලෙසින් අවුරුදු 30ක කාලයක් තුළ ගෙවීම් කිරීමටත්ය. නමුත් එම උසාවි නියෝගය අනුව කටයුතු නොතිබුණි. | මේ සම්බන්ධයෙන් මා විසින් අනු කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුවේ තීරණ ලද පසු ඉදිරි ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරමි. | නිල නිවාසවල පදිංචි වී සිටින කුලී නිවසියන්ගෙන් කුළී අය කර ගැනීමට හා උසාවි නියෝගය අනුව ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

---------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2021 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 29 කට අදාලව තිරසාර සංවර්ධන අරමුණු 75ක් යටතේ දර්ශක 136ක ප්‍රගතිය දක්වා තිබුණි. ඉන් දර්ශක 16ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක්ද, දර්ශක 42ක ප්‍රගතිය සියයට 50 – 74 අතර අගයකද පැවතුණි. දර්ශක 15 කට අදාලව ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. | කෝවිඩ් 19 වෛරසය ව්‍යාප්තියත් සමඟම ජනජීවිතය පවත්වාගෙන යාමේ කාර්යයන් ප්‍රමුඛව සිදු කිරීම රජයේ කාර්යභාරය වූයෙන් කාර්යසාධන දර්ශකයන්හි ප්‍රගතිය පහල අගයක පැවතුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා අනුමත සේවක සංඛ්‍යාව 1,423ක් ද, තත්‍ය සේවක සංඛ්‍යාව 1,237ක් ද, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 248ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 62ක් විය. සංවර්ධන නිළධාරි සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 107ක් වුවද එම සේවයේ තත්‍ය සේවක සංඛ්‍යාව 169ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 62ක් විය. පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය කළමනාකරණ සේවයේ තනතුරු පුරප්පාඩු 90ක් හා ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 87ක් නිරීක්ෂණය වූයෙන් එය මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකි බවද නිරීක්ෂණය විය. | මෙම පවතින පුරප්පාඩු සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව යොමු කළ බවද, ග්‍රාම නිලධාරීන් III ශ්‍රේණියට බඳවා ගැනිමේ තරඟ විභාගය ගැසට් කළද රටේ පැවැති කෝවිඩ් වසංගත තත්වය හමුවේ එය නොපැවැත්වූ බවද කළමනාකරණ සේවයේ පුරප්පාඩු සඳහා නවක සංවර්ධන නිළධාරීන් මඟින් මෙම රාජකාරී කටයුතු ආවරණය කර ගනිමින් හා ග්‍රාම නිලධාරී පුරප්පාඩු වැඩබලන නිලධාරීන් යෙදවීමෙන් සපුරා ගැනීමට කටයුතු කර කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවයක් ලබා දීමට කටයුතු කර ඇත. සංවර්ධන නිලධාරීන් බඳවා ගැනිම රජයේ ප්‍රතිපත්තියට අනුකූලව සිදු කර ඇති බවත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල කාර්ය භාරය වර්ධනය විම සමඟ ඉතා පුළුල් පරාසයක පැතිර ඇති බැවින් මෙම අතිරික්ත සංවර්ධන නිලධාරීන් ඵලදායි හා කාර්යක්ෂම රාජ්‍ය සේවා කටයුතුවලට යොදවා ඇත. | පවතින කාර්ය මණ්ඩලය අඛණ්ඩව කාර්යක්ෂම සේවයක් ලබාදීමට ප්‍රමාණවත් නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කරවා ගැනීමටද, නැතහොත් අදාල පුරප්පාඩු පුරවා ගැනීමටද කටයුතු කල යුතුය. |